අනිවාර්ය නිරෝධායනය යටතේ නිරෝධායන මධ්‍යස්ථානවල සිටින සමීප ආශ්‍රිතයින්
නිතර අසන ප්‍රශ්න

## අන්තර්ගත වගුව


**පසුබිම**

**නිතර අසනු ලබන ප්‍රශ්න**

*පොදු*

1. නිරෝධායන මධ්‍යස්ථාන තිබෙන්නේ කොහේද?
2. මා නිරෝධායනය කළ යුතු නම්, ඒ බව දැනුම් දෙන්නේ කවුරුන් විසින්ද?
3. COVID-19 සඳහා මෑතකදී කළ සෘණාත්මක පරීක්ෂණ වාර්තාවක් මා සතුව ඇත්නම්, මා නිරෝධායනයෙන් නිදහස් කළ හැකිද?
4. නිරෝධායනය කොපමණ කාලයක් පවතීද?

*නිරෝධායන මධ්‍යස්ථානයකට යෑවීමට පෙර*

5. මා නිරෝධායන මධ්‍යස්ථානයට යවන්නේ කවදාද?
6. නිරෝධායන මධ්‍යස්ථානය වෙත යවන වාහනය කුමක්ද?
7. නිරෝධායන මධ්‍යස්ථානයක් වෙත යාමට බලාපොරොත්තුවෙන් සිටියදී, මට අසනීප බවක් දැනේ නම්, මා කුමක් කළ යුතුද?
8. මට විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු නිදන්ගත රෝග තත්වයක් හෝ විශේෂ අවශ්‍යතා සහිත තත්වයක් තිබේ. නිරෝධායන මධ්‍යස්ථානයේ ඒ සම්බන්ධයෙන් පූර්වාරක්ෂාවක් තිබේද?
9. නිරෝධායන මධ්‍යස්ථානයට භාරකරුවෙකු රැගෙන යාමට මා හට අවශ්‍ය නම්, කුමක් කළ යුතුද?
10. නිවසෙහි සුරතල් සතුන් සිටී නම්, මා කුමක් කළ යුතුද?

*නිරෝධායන මධ්‍යස්ථානයේ රැඳී සිටියදී*

11. නිරෝධායන මධ්‍යස්ථානයේදී සපයනු ලබන්නේ කුමක්ද?
12. නිරෝධායන මධ්‍යස්ථානයේදී සහාය ලබා ගැනීම සඳහා මා සම්බන්ධ විය යුත්තේ කවුරුන් සමගද?
13. මට අසනීප බවක් දැනේ නම් මා කළ යුත්තේ කුමක්ද?
14. මගේ පෞද්ගලික සෞඛ්‍යය හා සනීපාරක්ෂාව සඳහා මා නිරීක්ෂණය කළ යුත්තේ කුමක්ද?
15.නිරෝධායන මධ්‍යස්ථානයෙහි දුම් පානය කිරීමට අවසර තිබේද?
16. මට මගේ කාමරයෙන් පිටවිය හැකිද?
17. නිරෝධායන කාල සීමාව තුළ හදිසි කාරණා සඳහා මා හට නිරෝධායන මධ්‍යස්ථානයෙන් ඉවත් විය හැකිද?

18. නිරෝධායන මධ්‍යස්ථානයෙන් පිටත සිටින කෙනෙකුට මට වැදගත් ව්‍යාපාරික භාණ්ඩ ලබා දිය හැකිද?

19. නිරෝධායන මධ්‍යස්ථානයට මා බැලීමට යමෙකුට පැමිණිය හැකිද?

*නිරෝධායනය අවසන් වූ පසු*

20. නිරෝධායන මධ්‍යස්ථානයෙන් පිටවීම සඳහා ඇති ප්‍රවාහන ක්‍රමවේදය කුමක්ද?

21. නිරෝධායන කාලය අවසන් වූ පසු, COVID-19 වලින් ආරක්ෂා වීම සඳහා මා විසින් නිරීක්ෂණය කළ යුත්තේ කුමක්ද?

*වෙනත් ප්‍රශ්න*

22. මා නිරෝධායන මධ්‍යස්ථානයේ නැවතී සිටින අතරතුර මගේ නිවස විෂබීජහරණය කිරීමට අවශ්‍ය නම්, ඒ සඳහා අනුගමනය කරන ක්‍රමවේදය කුමක්ද?

23. මා සමග එකම ඒකකයෙහි නිරෝධායනයට ලක් වන අයෙකුට COVID-19 වැළදී ඇති බව සනාථ වුවහොත්, මගේ නිරෝධායන කාල පරිච්ඡේදයෙහි යම් වෙනසක් සිදුවනු ඇත්ද?

පසුබිම

රෝග නිවාරණය හා පාලනය කිරීමේ ආඥා පනත (599 වන වගන්තිය) යටතේ, තහවුරු කරන ලද රෝගීන්ගේ සමීප ආශ්‍රිතයින් නිරෝධායන මධ්‍යස්ථානවල අනිවාර්ය නිරෝධායනයට ලක් කිරීම සඳහා නියෝග නිකුත් කිරීමට රජයට බලය ඇත.

අනිවාර්ය නිරෝධායන නියෝගය යටතේ, රෝගීන්ගේ සමීප ආශ්‍රිතයින් නිශ්චිත කාලයක් නිරෝධායන මධ්‍යස්ථානයේ රැඳී සිටිය යුතු අතර, ඊට අනුකූල නොවන අයට දඩ මුදල් නියම කිරීමට හා සිරගත කිරීමට හැකිය.

නිතර අසනප්‍රශ්න

<u>පොදු</u>

**1. නිරෝධායන මධ්‍යස්ථාන පිහිටා තිබෙන්නේ කොහේද?**

අනිවාර්ය නිරෝධායනය යටතේ දැනට තහවුරු කර ඇති රෝගීන්ගේ සමීප ආශ්‍රිතයින් නමුත්, COVID-19 රෝග ලක්ෂණ නොමැති පුද්ගලයින් සඳහා පහසුකම් සැපයීමට රජය විසින් නිරෝධායන මධ්‍යස්ථාන පිහිටුවා තිබේ.
දැනට භාවිතයේ පවතින නිරෝධායන මධ්‍යස්ථාන ලැයිස්තුව (https://www.chp.gov.hk/files/pdf/quarantine_centre_en.pdf) වෙබ් අඩවිය වෙතින් සොයාගත හැකිය.

**2.** මා නිරෝධායනය කිරීමට අවශ්‍ය නම්, ඒ බව මා හට දැනුම් දෙන්නේ කවුද?

කෝවිඩ් 19 පිළිබඳ වසංගත රෝග විද්‍යාත්මක පරීක්ෂණ සිදු කර රෝගය පිළිබඳ තහවුරු කිරීම හා සමීප ආශ්‍රිතයින් සොයා ගැනීම සෞඛ්‍ය ආරක්ෂණ මධ්‍යස්ථානය (සී.එච්.පී) විසින් සිදු කරනු ලබයි. ඔබව අනිවාර්ය නිරෝධායනට යටත් කරන්නේ නම්, ඔබගේ අනන්‍යතාව තහවුරු කර ගැනීමට හා ඒ පිළිබඳව දැනුම් දීමට ඒ සඳහා බලයලත් නිලධාරීන් ඔබ හා සම්බන්ධ වනු ඇත.
බලයලත් නිලධාරීන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීමට ඔබට අවශ්‍ය නම්, ඒ සඳහා සෞඛ්‍ය ආරක්ෂණ මධ්‍යස්ථානයෙහි 2125 1111 හෝ 2125 1122 යන ක්ෂණික ඇමතුම් අංක ඔස්සේ සම්බන්ධ විය හැකිය.

**3.** **COVID-**19 සඳහා මෑතකදී ලබා ගත් සෘණාත්මක පරීක්ෂණ වාර්තාවක් මා සතුව ඇත්නම් මා නිරෝධායනයෙන් නිදහස් කළ හැකිද?

නැත, මෑත කාලීන සෘණාත්මක පරීක්ෂණ වාර්තාවක් සමීප ආශ්‍රිතයින් නිරෝධායනයෙන් නිදහස් නොකරයි.

**4.** නිරෝධායන කාලය කොපමණද?

නිරෝධායන කාලසීමාව, නිරෝධායන පනත අනුව නියම කර ඇත. සාමාන්‍ය තත්වයක් යටතේ, සමීප ආශ්‍රිතයින් දින 14 ක් දක්වා නිරෝධායනයට යටත් ය. (උදා: තහවුරු වූ රෝගියා සමග අවසන් වරට සම්බන්ධතා පැවැත්වූයේ ජනවාරි 1 වැනිදා නම්, නිරෝධායන කාලය ජනවාරි 15 වැනිදා 23:59 දක්වා)

<u>නිරෝධායන මධ්‍යස්ථානයකට මාරු කිරීමට පෙර</u>

**5.** මා නිරෝධායන මධ්‍යස්ථානයට යවන්නේ කවදාද?

සාමාන්‍යයෙන්, සෞඛ්‍ය ආරක්ෂණ මධ්‍යස්ථානය විසින් සමීප ආශ්‍රිතයකු බවට තහවුරු කිරීමෙන් පසු පැය 24 ක් ඇතුළත නිරෝධානය මධ්‍යස්ථානයක් කරා යැවිය හැකිය. අවශ්‍ය නම්, සමීප ආශ්‍රිතයා නිරෝධායන මධ්‍යස්ථානයක් වෙත යැවීම පිළිබඳ දැන ගැනීමට 2125 2600 අංකයෙන් සෞඛ්‍ය ආරක්ෂණ මධ්‍යස්ථාන ( CHP) යෙහි නිරෝධායන කාර්ය සාධක බලකාය ඇමතීමට ඔබට හැකියාව පවතී.

COVID-19 සම්බන්ධ වෙනත් කරුණු දැන ගැනීම සඳහා කරුණාකර සෞඛ්‍ය ආරක්ෂණ මධ්‍යස්ථානයෙහි (2125 1111 හෝ 2125 1122) ක්ෂණික ඇමතුම් අංකයට අමතන්න.

හදිසි අවස්ථාවකදී, ක්ෂණික සහාය සඳහා කරුණාකර 999 අමතන්න.

**6.** නිරෝධායන මධ්‍යස්ථානයට ප්‍රවාහනය කරන්නේ කෙසේද?

සමීප ආශ්‍රිතයා නියමිත පරිශ්‍රයේ සිට (පදිංචි ස්ථානය හෝ රෝහල වැනි) නියමිත නිරෝධායන මධ්‍යස්ථානය වෙත ගෙන යනු ලැබේ. එමෙන්ම, අනෙකුත් තහවුරු වූ රෝගීන්ගේ සමීප ආශ්‍රිතයින් සිටිය හැකි අතර, ආශ්‍රිතයින් සමීප දුරකින් වාසය කරන අවස්ථාවන්හි, නම් කරන ලද එක් වාහනයකින් එකට රැගෙන යනු ලැබේ.

**7.** නිරෝධායන මධ්‍යස්ථානයක් වෙත යාමට බලාපොරොත්තුවෙන් සිටියදී මට අසනීප බවක් දැනේ නම් මා කුමක් කළ යුතුද?

හදිසි අවස්ථාවකදී, කරුණාකර ක්ෂණික සහාය සඳහා 999 අමතා, ඔබ නිරෝධායන මධ්‍යස්ථානයට යාමට බලා සිටින සමීප ආශ්‍රිතයකු බව රාජකාරියෙහි නිරත නිලධාරියාට දන්වන්න.

**8.** මට විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු නිදන්ගත රෝගී තත්වයක් හෝ විශේෂ අවශ්‍යාවන් තිබේ. මට පූර්වාරක්ෂාවක් තිබේද?

ඔබට කිසියම් රෝගී තත්ත්වයක් හෝ දිගු කාලීන ප්‍රතිකාර ලබා ගැනීමේ තත්ත්වයක් තිබේ නම්, කරුණාකර නිරෝධායන මධ්‍යස්ථානයෙහි කාර්ය සාධක බලකායේ නිලධාරීන් හට එය දන්වන්න.

එවිට, අවශ්‍ය සත්කාර මට්ටම සලකා, ඔබව වෛද්‍ය සහය ඇතිව නිරෝධායන මධ්‍යස්ථානයකට රැගෙන යාම කළ හැකිය. කරුණාකර, ඔබේ ඖෂධද නිරෝධායන මධ්‍යස්ථානයට ගෙන එන්න.

විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින් (නිදන්ගත වෛද්‍ය රෝග, ආබාධ සහිත පුද්ගලයින්, විශේෂ ආහාර වේල් සහිත අය, කිරි දෙන මව්වරුන්, වයස අවුරුදු 3 ට අඩු කුඩා දරුවන් ආදීන්) නිශ්චිත නිරෝධායන මධ්‍යස්ථානයකට පමණක් යැවීම සිදු කළ හැකිය. එම නිසා නිරෝධායන මධ්‍යස්ථානයේ කාර්ය සාධක බලකායේ නිලධාරීන් ඔබ හා සම්බන්ධ වූ විට කරුණාකර, විශේෂ අවශ්‍යතා පිළිබඳව ඔවුන් දැනුවත් කරන්න.

**9.** මා හට නිරෝධායන මධ්‍යස්ථානයට යාමට භාරකරුවෙකු අවශ්‍ය නම් කුමක් කළ යුතුද?

සමීප ආශ්‍රිතයින්ගේ භාරකරුවකු හට නිරෝධායන මධ්‍යස්ථානයට යාම සඳහා අවසර අවශ්‍ය විය හැකිය. ඒ සඳහා සලකා බැලීම පිණිස, භාරකරුගේ සම්පූර්ණ නම සහ HKID අංකය ඇතුළු අදාළ තොරතුරු සැපයිය යුතුය. ඊට අනුමැතිය ලැබුණහොත්, නිරෝධායන කාලය අවසන් වන තෙක් භාරකරු එහි රැඳී සිටිය යුතු අතර, නිරෝධායන මධ්‍යස්ථානයේ අදාළ කාර්ය මණ්ඩල උපදෙස් පිළිපැදීමද සිදු කළ යුතුය.

**10.** නිවසෙහි සුරතල් සතුන් සිටී නම් මා කුමක් කළ යුතුද?

ඔබේ සුරතල් සතුන්ගේ සුභසාධනය පිණිස, ඔවුන් ඥාතීන් හෝ මිතුරන් ගේ රැකවරණය යටතේ තැබීමට විධිවිධාන යෙදීම වඩාත් සුදුසුය. මෙය කළ නොහැකි නම්, කෘෂිකර්ම, ධීවර හා සංරක්ෂණ දෙපාර්තමේන්තුව (AFCD) ආදියෙහි මූලික සුරතල් සතුන් රැකබලා ගැනීමේ සේවාවන් වෙතින් සහය ඉල්ලා සිටිය හැකි නමුත්, එය සේවාව පැවතීම මත තීරණය වේ.

<u>නිරෝධායන මධ්‍යස්ථානයේ රැඳී සිටියදී</u>

**11.** නිරෝධායන මධ්‍යස්ථානයේදී සපයන්නේ කුමක්ද?

නිරෝධායන මධ්‍යස්ථාන මගින් මූලික ගෘහ භාණ්ඩ, මූලික පෞද්ගලික අවශ්‍යතා (දත් පේස්ට්, දත් බුරුසු, තුවා, ටොයිලට් පේපර්ස්, ෂැම්පූ සහ බොඩි වොෂ් ආදිය) හා විකල්පයක් ලෙස නිර්මාංශ ආහාර සහිතව දිනකට ආහාර වේල් තුනක් සමග නොමිලේ නවාතැන් පහසුකම් සපයයි. අවශ්‍ය පරිදි ජංගම දත්ත සමග පෞද්ගලික ඉලෙක්ට්‍රොනික උපාංග ආදී පුද්ගලික බඩු බාහිරාදිය ගෙන එන ලෙසට ඔබට උපදෙස් දෙනු

ලැබේ. නිරෝධායන මධ්‍යස්ථානයේ රෙදි සෝදන සේවාවක් නොමැති බැවින්, ප්‍රමාණවත් ඇඳුම් ගෙන ඒමට ද ඔබ වෙත යෝජනා කෙරේ.

**12.** නිරෝධායන මධ්‍යස්ථානයේදී සහාය සඳහා මා සම්බන්ධ විය යුත්තේ කා සමගින්ද?

ඔබ පැමිණි පසු නිරෝධායන මධ්‍යස්ථානයේ සහාය ලබා ගැනීම සඳහා දුරකථන අංකයක් ඔබ වෙත ලබා දෙනු ඇත. ඔබ රැඳී සිටින කාලය තුළ කිසියම් ප්‍රශ්නයක් මතු වේ නම් හෝ සැපයුම් අවශ්‍ය නම්, කරුණාකර සහාය සඳහා එම අංකයට අමතන්න. නිරෝධායන මධ්‍යස්ථානය මගින් මූලික දෛනික අවශ්‍යතා සහ ආහාර පමණක් සපයයි. නිරෝධායන මධ්‍යස්ථානය විසින් සපයනු නොලබන, අත්‍යවශ්‍ය භාණ්ඩ ඔබට අවශ්‍ය නම්, කරුණාකර එම භාණ්ඩ රැගෙන එන ලෙස, පවුලේ සාමාජිකයෙකුගෙන් හෝ මිතුරෙකුගෙන් ඉල්ලා සිටින්න. කරුණාකර, ඒ සඳහා අවසර ලබා ගැනීමට නිරෝධායන මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය අමතන්න.

**13.** මට අසනීප බවක් දැනේ නම් මා කළ යුත්තේ කුමක්ද?

සහය ලබා ගැනීම සඳහා නිරෝධායන මධ්‍යස්ථානය විසින් ලබා දෙන ලද දුරකතන අංකයට ඔබ විසින් ඇමතිය යුතුය. ප්‍රථමාධාර හෝ සෞඛ්‍ය සේවා වෘත්තිකයන් ඔබගේ තත්වය පරීක්ෂා කර අවශ්‍ය නම්, වැඩිදුර ප්‍රතිකාර සඳහා ඔබව රෝහලට යැවිය හැකිය.

**14.** මගේ පෞද්ගලික සෞඛ්‍යය හා සනීපාරක්ෂාව සඳහා මා නිරීක්ෂණය කළ යුත්තේ කුමක්ද?

කරුණාකර සෑම විටම ඔබගේ කාමරය තුළ රැඳී සිටිමින් කාර්ය මණ්ඩලය සමග සන්නිවේදනය සඳහා ඔබේ ජංගම දුරකතනය ක්‍රියාකාරී තත්වයේ තබා ගන්න. කරුණාකර වෛද්‍ය සහය සඳහා කාර්ය මණ්ඩලයේ උපදෙස් අනුගමනය කරන්න
ශරීරයේ උෂ්ණත්වය සහ රෝග ලක්ෂණ නිරන්තරයෙන් අධීක්ෂණය කිරීම සහ COVID-19 තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා වන සාම්පල තබා ගැනීම ඇතුළු නිරීක්ෂණ ඔබ විසින් කළ යුතුය. අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීම ආදීපෞද්ගලික සනීපාරක්ෂාව පවත්වා ගැනීම සඳහා කරුණාකර කාර්ය මණ්ඩලයේ උපදෙස් අනුගමනය කරන්න.

**15.** නිරෝධායන මධ්‍යස්ථානයේ දුම් පානය කිරීමට අවසර තිබේද?

සියලුම නිරෝධායන මධ්‍යස්ථානවල දුම් පානය තහනම්ය.

**16.** මට මගේ කාමරයෙන් පිටවිය හැකිද?

නිරෝධායන මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයේ උපදෙස් පරිදි මිස, ඔබ ඔබේ කාමරයේ රැඳී සිටිය යුතුය.

**17.** නිරෝධායන කාල සීමාව තුළ හදිසි කාරණා සඳහා මා හට නිරෝධායන මධ්‍යස්ථානයෙන් ඉවත් විය හැකිද?

අනිවාර්ය නිරෝධායනය යටතේ සමීප ආශ්‍රිතයින් නිරෝධායන කාලය තුළ නිරෝධායන මධ්‍යස්ථානයේ රැඳී සිටිය යුතුය. පුද්ගලික කාරණා වලට සහභාගී වීමට තාවකාලික අවසර නොමැත. සලකා බලනු ලබන්නේ, අතිශය විශේෂිත ඉල්ලීම් පමණි.

**18.** නිරෝධායන මධ්‍යස්ථානයෙන් පරිබාහිර අයකුට වැදගත් ව්‍යාපාරික භාණ්ඩ ලබා දීමට මා හට හැකිද?

වෛරසය ආසාදනය හෝ ප්‍රජා සම්ප්‍රේෂණය වීමේ අවදානම අවම කිරීම සඳහා, නිරෝධායන මධ්‍යස්ථානයට ගෙන යන අයිතම ඔබේ නිරෝධායන කාලය අවසන් වීමට පෙරාතුව, ඉන් පිටත යැවීමට අවසර නැත.

**19.** මා බැලීමට යමෙකුට නිරෝධායන මධ්‍යස්ථානයට පැමිණිය හැකිද?

නිරෝධායන මධ්‍යස්ථානයට පැමිණීමට අවසර නොමැත. පවුලේ සාමාජිකයෙකු හෝ මිතුරෙකු විසින් ඔබ වෙත ගෙන ඒමට අත්‍යවශ්‍ය සැපයුමක් වේ නම්, එම කටයුතු පිළියෙළ කිරීම සඳහා නිරෝධායන මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය අමතන්න (කරුණාකර කාර්ය මණ්ඩලයේ උපදෙස් පරිදි බෙදා හැරීමේ කාල පරාසයන් සහ සීමාවන් නිරීක්ෂණය කරන්න).

<u>නිරෝධායනය අවසන් වූ පසු</u>

**20.** නිරෝධායන මධ්‍යස්ථානයෙන් පිටවීම සඳහා වන ප්‍රවාහන ක්‍රමවේදය කුමක්ද?

නිරෝධායන කාලය අවසන් වූ වහාම හෝ පසුදා උදේ ආහාරයෙන් පසුව නිරෝධායන මධ්‍යස්ථානයෙන් පිට වීමට ඔබට තෝරා ගත හැකිය. නිරෝධායන මධ්‍යස්ථානය විසින් පිළියෙළ කර ඇති වාහනයක් මගින් ළඟම ඇති එම්.ටී.ආර් දුම්රිය ස්ථානයට ඔබව ප්‍රවාහනය කළ හැකිය.

21. **නිරෝධායන කාලය අවසන් වූ පසු COVID-19 වලින් ආරක්ෂා වීමට මා නිරීක්ෂණය කළ යුත්තේ කුමක්ද?**

හැකි තරම් අනෙකුත් පුද්ගලයින් සමග සුදුසු සමාජ දුරස්ථභාවයක් පවත්වා ගැනීම සහ සෑම විටම දැඩි පෞද්ගලික හා පාරිසරික සනීපාරක්ෂාව පවත්වා ගැනීම, කෝවිඩ් ආසාදනයට එරෙහිව පුද්ගලිකව ආරක්ෂා වීමට සහ ප්‍රජාව තුළ COVID-19 පැතිරීම වැළැක්වීම සඳහා වැදගත් වේ. කරුණාකර සෞඛ්‍ය උපදෙස් සඳහා ‘COVID-19 තේමාත්මක වෙබ් අඩවිය' (www.coronavirus.gov.hk) සමග රැඳී සිටින්න.

<u>වෙනත් ප්‍රශ්න</u>

22. **මා නිරෝධායන මධ්‍යස්ථානයේ නැවතී සිටින අතරතුර මගේ නිවස විෂබීජහරණය කිරීමට අවශ්‍ය නම්, ඒ සඳහා වන ක්‍රමවේදය කුමක්ද?**

ඔබ නිරෝධායන මධ්‍යස්ථානයේ නැවතී සිටින අතරතුර ඔබේ නිවසට විෂබීජහරණය කිරීමට අවශ්‍ය බව සෞඛ්‍ය නිවාරණ කාර්යාංශය විසින් ඔබට දන්වා ඇත්නම්, කරුණාකර ඔබේ නිවසට පිවිසිය හැකි ඥාතීන් හෝ මිතුරන් මගින් දොර විවෘත කරවා, ආහාර හා පාරිසරික සනීපාරක්ෂක දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට විෂබීජහරණ කටයුතු සිදු කිරීමට ඉඩ සලසන්න. එවැන්නක් සිදු කළ නොහැකි නම්, ඔබේ නිවසෙහි යතුරු නිරෝධායන මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලයට භාර දිය හැකි අතර, ඔවුන් විසින් ඔබේ නිවස විෂබීජහරණය කරන පිරිස් වෙත භාර දෙනු ඇත. නිරෝධායන කාලය අවසන් වීමට පෙර, ඔබේ නිවස විෂබීජහරණය කිරීමද යතුරු නැවත භාර දීමද හැකි තරම් ඉක්මනින් සිදු වනු ඇත.

23. **එකම ඒකකයේ මා සමග නිරෝධායනයට ලක් වන වන අයෙකුCOVID-19 ආසාදිතයකු බවට තහවුරු වුවහොත්, මාගේ නිරෝධායන කාල පරිච්ඡේදයේ යම් වෙනසක් සිදුවනු ඇත්ද?**

එවිට, නිරෝධායන පනතෙහි දක්වා ඇති පරිදි, ඔබේ නිරෝධායන කාලය දීර්ඝ කෙරේ.